


තිසර අන්තර්ජාල ගුවන්විදුලිය ජූනි 15 වන දිනට තුන් වසරක් පසුකරයි. වසර තුනක් පුරා දිනකට පැය විසිහතරක කාලයක් ගුවන් ගත වන තිසර ලොව පුරා විසිරී සිටින අති විශාල ශ්‍රී ලාංකික ශ්‍රාවකයන් පිරිසකගේ ආදරය දිනාගෙන තිබෙන බව පෙනෙයි. අවම වශයෙන් රටවල් 40 ක සිටින ශ්‍රී ලාංකිකයන් තිසරට සවන් දෙන බව සංඛ්‍යා ලේඛණ පෙන්වා දෙයි.

නූතන තාක්ෂණය විසින් සමස්ථ මාධ්‍ය කලාව වෙනස් කර ඇත. අද ගුවන් විදුලියද භෞතික සීමා මායිම් බිඳ දමමින් නගරයෙන් නගරයටත් රටෙන් රටටත් ඇදී යන්නේ තව දුරටත් ප්‍රදේශයකට හෝ රටකට හෝ සීමා විය යුතු නැති බව පෙන්වා දෙමිනි. ලෝකයේ ඕනෑම අස්සක මුල්ලක සිටින්නෙකුට වුවද ගුවන්විදුලියට සවන් දීමේ ඉඩකට තාක්ෂණය විසින් ලබා දෙනු ලැබ ඇත. තිසර ඒ තාක්ෂණය යොදා ගනිමින් ගුවනට එක්වන්නේ www.thisara.com වෙබ් අඩවිය ඔස්සේය. එයට අමතරව ඉන්ටනෙට් ගුවන් විදුලි යන්ත්‍ර හරහාත් ටියුන් ඉන් ඇප් එක හරහා ස්මාට් ෆෝන් ඔස්සේත් තිසරට සවන් දිය හැකිය. ටියුන් ඉන් ඇප් එක හරහා තිසර අසන විට "Thisara" යනුවෙන් සර්ච් කරන්න

ඔබ සතුව අන්තර්ජාල ගුවන්විදුලි යන්ත්‍රයක් තිබේ නම් තිසරට ගුවන්විදුලියට සුසර කරගැනීමට අදාල තාක්ෂණික තොරතුරු සඳහා www.thisara.com වෙබ් අඩවියට ගොඩවන්න

තිසර ආරම්භයේ සිට වරින් වර එයට සහය දුන් අය රැසකි. චරිත දිසානායක, සිසිර දිසානායක, මහීල් මුණිදාස, ශ්‍රිනාත් මද්දුමගේ, දිනෙල්කා දර්ශණී, තුෂාරි මුණුගොඩ, පැතුම් තිලකසිරි, සහන් වීරසේ කර යන සහෘදයෝ ඔස්ට්‍රේලියාවේ සිට දෙන සහය විශාලය.

ප්‍රවීණ මාධ්‍යවේදී අසෝක තිලකරත්න ශ්‍රී ලංකාවේ සිට සතිපතා එවන හෝපලු අරණ වැඩසටහනත් ගාමිණී සිරිවර්ධන නවසීලන්තයේ සිට එවන රන් දෙරණ වැඩ සටහනත් අද දක්වාම නොකඩවා විකාශය වන වැඩ සටහන් දෙකකි. ශ්‍රී ලංකාවේ සිට මාධ්‍යවේදී ශ්‍රීලාල් සෙනෙවිරත්න එවන විවිධ වැඩ සටහන් තිසර රසවත් කරයි. එසේම විවිධ වැඩ සටහන් සංස්කරණයට ශ්‍රී ලංකාවේ සිට දායක වන නුවන් ප්‍රදීප් සොහොයුරා ද තිසර ඔබ වෙත ගෙන එන්නට සිය ශ්‍රමය වැය කරන අය අතර සිටියි.

තිසර ගුවන් විදුලුයේ විශේෂත්වය වන්නේ ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි විසින් අමතක කරනු ලැබ ඇති සුභාවිත ගීතයට විශාල ඉඩ කඩක් ලබා දීමයි.

ඔස්ට්‍රේලියාවේ සිට ගායන ක්ෂෙත්‍රයට එක්වන රෝහණ කරුණාරත්න, ලලිත් අරුණශාන්ත, ශ්‍රීපාලි එදිරිසිංහ, පුෂ්පා තිසේරා, ශිරෝමා ප්‍රනාන්දු, අසුන්තා කරුණාරත්න, සෙව්වන්දිකා අබේරත්න, නොයෙල් පෙරේරා, විජිත අමරසේකර, හේමන්ත ඩයස්, රොෂාන් ලින්තොටගේ, ධම්මිකා දේවසුරේන්ද්‍ර චමරි වීරකෝන් සහ තවත් ගායක ගායිකාවන් රැසකගේ ගී තිසර ඔස්සේ දිනපතා ලොව පුරා විකාශය වෙයි

තිසර මීළඟ පියවර වන්නේ සිකුරාදා සවස 7 සිට 8 දක්වා සජීවී ලෙස ශ්‍රාවකයන් හමුවන "තිසර සුන්දර සිකුරාදා" වැඩසටහනයි. ඒ සඳහා අවශ්‍ය වන සියළු තාක්ෂණික කටයුතු සුනන්ද කුරේ ගේ දායකත්වයෙන් මේ වන විට නිමවා ඇත. වැඩ සටහන ආරම්භ වන දිනය පිළිබඳව විමසිලිමත්ව සිටින්න.

ඒ සමගම තිසරට සම්බන්ධ වෙලා වැඩසටහන් කරන්න ඔබටත් අවස්ථාව තිබෙනවා. ඔබේ නිවසේ සිටම වැඩ සටහන පටිගත කර තිසරට එවන්න ඔබට පුලුවන්. අවශ්‍ය තාක්ෂණික සහයෝගය දෙන්නත් තිසර සූදානම්. ඒ සඳහා විහාල පිරිවැයක් දරන්න වෙන්නෙ නැහැ. ඔබේ පරිගණකයත් මෛක්‍රෆෝනයකුත් ඔබේ හැකියාවත් පමණයි අවශ්‍ය වෙන්නෙ. තිසර කියන්නෙ දොරවල් වහගත්ත තැනක් නෙවෙයි. ඔබ දක්ෂයෙක් නම් තිසර ඔබට විවෘතයි. එන්න අදම තිසර හා එක්වන්න.

ඔබත් තිසරට සවන් දුන්නේ නැත්නම් අදම තිසර වෙබ් අඩවියට ගොඩවන්න. නැත්නම් ඔබේ ස්මාට් ෆෝනයේ ටියුන් ඉන් ඇප් එකට ගොස් Thisara යයි සඳහන් කර සර්ච් කරන්න. එසේත් නැත්නම් ඔබේ අන්තර්ජාල ගුවන් විදුලිය ඔස්සේ තිසරට සවන් දෙන්න. ලොවේ කොතැන සිටියත් තිසර ඔබ සමගයි.










